අරමුදල් කළමනාකරුගේ සමාලෝචනය

ආර්ථික සමාලෝචනය

ඇමරිකා එක්සත් ජනපදය, රුසියාව සහ ඉන්දියාව වැනි රටවල වඩාත් වැදගත් මැතිවරණ කිහිපයක් ද ඇතුළුව 2024 වසර සැලකිය යුතු ගෝලීය සිදුවීම් සනිටුහන් කළ වසරක් විය. බොහෝ මහ බැංකු ඔවුන්ගේ ප්‍රතිපත්ති අනුපාත කප්පාදු කිරීම ආරම්භ කළ වසරක් ලෙසද 2024 වර්ෂය සැළකිය හැකි අතර එය ඉහළ යන ආර්ථික ක්‍රියාකාරකම් වලට ප්‍රතිචාර වශයෙන් සිදුවිය. එක්සත් ජනපද මැතිවරණය හේතුවෙන් බැඳුම්කර ආදායම ඉහළයාමේ ප්‍රවණතාවක් දක්ණට ලැබුණු අතර , ෆෙඩරල් ණය ඉහළ යාම සහ ඉහළ උද්ධමනය සඳහා ඇති හැකියාව පිළිබඳ ගැටළු හේතුවෙන් එම ඉහළ යාමේ ප්‍රවණතාව දක්නට ලැබුණි. මේ අතර, චීනයේ ආර්ථිකය 2024 දී වසරින් වසර (YoY) 5.0% ක ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කළේය. 2024 දී තෙල් මිල සම්පූර්ණයෙන්ම සාමාන්‍ය තත්ත්වයට පත්වීමෙන් අනතුරුව සියයට 3ක් පමණ පහත වැටී ඇති අතර මෙය දෙවැනි වසරටත් අඛණ්ඩව මිල පහත වැටී ඇති අවස්ථාවකි. මෙයට හේතු වී ඇත්තේ කොවිඩ් වසංගතයෙන් පසුව ඇති වූ ඉල්ලුම් නැවත ඉහළයාමේ ප්‍රගතිය , චීනයේ ආර්ථිකයේ ඇති වූ අභියෝග සහ ඇමරිකාව සහ අනෙකුත් ඔපෙක් (OPEC**)** නොවන රටවල් මඟින් තෙල් නිෂ්පාදනය වැඩි කිරීමයි. එමඟින් දැනටමත් ප්‍රමාණවත් ලෙස සැපයුමක් ඇති ලෝක වෙළෙඳපොළට තවත් තෙල් එකතු විය. 2025 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ලෝක ආර්ථික දැක්ම යාවත්කාලීන කිරීමට අනුව, 2025 දී ගෝලීය වර්ධනය 3.3% ක් ලෙස පුරෝකථනය කර ඇති අතර එයට ප්‍රධාන වශයෙන් එක්සත් ජනපදයේ ඉහළ යාමේ තත්ත්වයත් අනෙකුත් ප්‍රධාන ආර්ථිකයන්හි පහළයාමේ තත්ත්වයත් බලපා ඇත. මේ අතර ගෝලීය උද්ධමනය 2025 දී 4.2% කින් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2022 සහ 2023 වසරවලදී අඛණ්ඩව වසර දෙකක දළ දේශීය නිෂ්පාදිතය පහත වැටීමෙන් පසු 2024 දී ශ්‍රී ලංකා ආර්ථිකය වසරින් වසර (YoY) 5.00% ක ධනාත්මක වර්ධනයක් වාර්තා කළේය. කෘෂිකාර්මික අංශය +1.2%[4] කින්, කාර්මික අංශය +11.0%[4] කින් සහ සේවා අංශය +2.4%[4] කින් වර්ධනය වීමත් සමඟ ප්‍රධාන අංශ හරහා කැපී පෙනෙන ප්‍රසාරණයන් මෙම වර්ධනයට හේතු විය. සංචාරක ව්‍යාපාරයෙන් ඩොලර් බිලියන 3.16 ක හිතකර ගලා ඒම් සහ ඩොලර් බිලියන 6.5 ක ප්‍රේෂණ ප්‍රවාහය වර්ධනයට උපකාරී විය.

2024 ජනාධිපතිවරණයෙන් සහ පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසුව දේශපාලන පරිසරය ස්ථාවරව පැවති අතර, රජය පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයක් ලබා ගත්තේය. එපමණක් නොව, ශ්‍රී ලංකාව එහි බාහිර ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ (EDR) ක්‍රියාවලිය සාර්ථකව අවසන් කළ අතර, එහි පැහැර හැරීමේ තත්ත්වයෙන් ඉවත් විමට හැකි විය. වර්තමානයේ, රට ෆිච් විසින් සිදුකරන ශ්‍රේණිගත කිරීමට අනුව CCC+ ණය ශ්‍රේණිගත කිරීමක් පෙන්නුම් කරයි. ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු කිරීම සාර්ව ආර්ථිකයේ ධනාත්මක වර්ධනයන් පෙන්නුම් කරයි.

ආර්ථිකය නිවැරදි දිශාවට ගමන් කරන බව පෙන්නුම් කරන ධනාත්මක බව පෙන්වන ඉහළ සංඛ්‍යාත දත්ත













පොලී අනුපාත වාතාවරණය

2024 දී, ආර්ථික වර්ධනය ශක්තිමත් කිරීමේ අරමුණින් මහ බැංකුව සහනශීලී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් පවත්වා ගෙන ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, මහ බැංකුව වසර පුරා පදනම් ඒකක 200 දක්වා ප්‍රතිපත්ති අනුපාත අඩු කිරීම් මාලාවක් ක්‍රියාත්මක කළේය. කෙටි කාලීනව අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා ගැඹුරු අවධමනකාරී තත්ත්වයන්, පවතින උද්ධමනකාරී පීඩනයන්, අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා හිතකර බාහිර ආර්ථික වර්ධනයන් සහ වෙළෙඳපොළ ණය අනුපාත තවදුරටත් අඩු කිරීම ඇතුළු ප්‍රධාන සාධක කිහිපයක් මෙම තීරණවලට බලපෑවේය.

මීට අමතරව, මහ බැංකුව තනි පොලී අනුපාත යාන්ත්‍රණයක් හඳුන්වා දුන් අතර, 2024 නොවැම්බර් 27 වන දින සිට බලපැවැත්වෙන පරිදි එක්දින ප්‍රතිපත්ති අනුපාතය 8.0%,[4] ලෙස නියම කළේය. මෙම ප්‍රතිපත්ති ගැලපීම් පිළිබිඹු කරමින්, රජයේ සුරැකුම්පත්වල ප්‍රතිලාභය ඇතුළුව වෙළෙඳපොළ පොලී අනුපාත සැලකිය යුතු ලෙස පහත වැටුණි. 2024 දෙසැම්බර් අවසානය වන විට, දින 91, දින 182 සහ දින 364 භාණ්ඩාගාර බිල්පත් අනුපාත පිළිවෙලින් 8.62%[4], 8.77%[4] සහ 8.96%[4] ලෙස පැවතුනි.

ආදායම් පාදක මූල්‍ය ඒකාබද්ධ කිරීමේ පියවරයන් සහ විශේෂයෙන් සංචාරක සහ සේවක ප්‍රේෂණ වලින් ලැබෙන ශක්තිමත් විදේශ මුදල් ගලා ඒම් හේතුවෙන් වෙළෙඳපොළ ද්‍රවශීලතාවයේ දියුණුවක් ද දක්නට ලැබුණි. පෞද්ගලික අංශයට ලබා දී ඇති ණය ප්‍රමාණය වසරින් වසර (YoY) 10.7% කින් ඉහළ ගොස් ඇති අතර එය වසර අවසානයේ රුපියල් බිලියන 8,156 ක් විය.

වැඩිදියුණු කළ ආදායම් නිසි ලෙස යෙදවීම හේතුවෙන් සහ වඩාත් ඵලදායී වියදම් කළමනාකරණ උපාය මාර්ග සමඟ රජය සිය මූල්‍ය ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කරගෙන ගියේය. 2024 දී තාවකාලික අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් 6.8% ක් විය. 2025 අයවැයෙන් රජය තම ආදායම පදනම් කරගත් මූල්‍ය ඒකාබද්ධ කිරීම අඛණ්ඩව සිදු කරගෙන යාමට අපේක්ෂා කරන බව පෙන්නුම් කර ඇත.









උද්ධමනය

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI, 2021 = 100) මගින් මනිනු ලබන ප්‍රධාන උද්ධමනය 2024 දෙසැම්බර් මාසයේදී -1.7%[4] කින් ලෙස සටහන් කරමින්

ආර්ථිකයේ අවධමනයක් වාර්තා කළේය. එම කාලය තුළ ආහාර උද්ධමනය 0.8%[4] දක්වා ඉහළ ගිය අතර ආහාර නොවන උද්ධමනය 3.0%[4] දක්වා ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් බලශක්ති මිල ගණන් සැලකිය යුතු ලෙස පහත වැටීම සහ අස්ථාවර ආහාර මිල ගණන් අඩුවීමේ අඛණ්ඩ බලපෑම හේතුවෙන් ඉදිරි මාසවලදී ප්‍රධාන උද්ධමනය ඍණාත්මකව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මීට අමතරව, බදු සංශෝධන හේතුවෙන් 2024 මුල් භාගයේදී දක්නට ලැබුණු මිල ඉහළ යාමෙන් ඇති වූ සැලකිය යුතු මූලික බලපෑම, මෙම පහළ යාමේ ප්‍රවණතාව තවදුරටත් ශක්තිමත් කරනු ඇත. කෙසේ වෙතත්, 2025 දෙවන භාගයේදී උද්ධමනය ධනාත්මක තත්ත්වයකට මාරු වනු ඇතැයි අපේක්ෂා කරන අතර, මධ්‍ය කාලීනව ඉලක්කගත 5.0%[4] මට්ටම කරා ක්‍රමයෙන් ගමන් කරනු ඇත.





බාහිර අංශය

ශ්‍රී ලංකා ආර්ථිකයේ බාහිර අංශය 2024 දී සැලකිය යුතු දියුණුවක් පෙන්නුම් කළ අතර, ඒ සඳහා සංචිත ශක්තිමත් වීම සහ ජංගම ගිණුමට ගලා ඒම හේතු විය. 2024 දී මහ බැංකුවේ විදේශ විනිමය මිලදී ගැනීම් හේතුවෙන් 2023 දී ඩොලර් බිලියන 4.4 ක් වූ රටේ දළ නිල සංචිතය 2024 දෙසැම්බර් මාසයේදී ඩොලර් බිලියන 6.1 ක් දක්වා ඉහළ ගිය අතර එය ඓතිහාසික ඉහළ මට්ටම්වල පැවතුනි. වෙළෙඳ භාණ්ඩ අපනයන සහ ආනයන යන දෙකම ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කළේය.

2024 දී වෙළෙඳ භාණ්ඩ අපනයනය 7.2%[4] කින් ඉහළ ගිය අතර ආනයනය 12.1%[4] කින් ඉහළ ගොස් ඩොලර් බිලියන 6.0 ක වෙළෙඳ හිඟයකට දායක විය. වෙළඳ හිඟය පුළුල් වුවද, ඩොලර් බිලියන 10.3 ක් පමණ දායක වූ සේවක ප්‍රේෂණ සහ සංචාරක ඉපැයීම් වලින් රටට ප්‍රතිලාභ ලැබුණි. මුදල් අංශයෙන්, 2024 දී ශ්‍රී ලංකා රුපියල 10.7% කින් ඉහළ ගිය අතර වසර අවසන් වූයේ එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ඩොලර් 292.584 ක් ලෙසිනි. කෙසේ වෙතත්, රජයේ සුරැකුම්පත් වෙළෙඳපොලේ විදේශ ආයෝජන 2024 දී ඩොලර් මිලියන 179 ක ශුද්ධ පිටතට ගලා යාමක් වාර්තා කළේය.

සටහන 01**:** බාහිර අංශයේ කාර්යසාධනය පිළිබඳ සාරාංශය[4]

වර්ගය	2023 ඇ.එ.ජ. ඩොලර්	2023 ඇ.එ.ජ. ඩොලර්	වෙනස **(%)**
භාණ්ඩ අපනයනය	11,910.7	12,772	7.2
වෙළෙඳ භාණ්ඩ ආනයනය	16,811.1	18,841.4	12.1
වෙළෙඳ ශේෂය	-4,900.4	-6,069.4	
සේවා ගිණුම් ශේෂය	3,053.0	3,654.5	19.7
සමස්ත ශේෂය	2,825.6	2,890.4	

CTCLSA වර්ධන කොටස් අරමුදල (ආරම්භය: **2012** පෙබරවාරි **27)**

අරමුදල් කළමනාකරු

කුහන් විනයාගසුන්දරම්

අරමුදලේ අරමුණ සහ පදනම

අරමුදල යනු මධ්‍ය කාලයේ සිට දිගු කාලයක් දක්වා ප්‍රාග්ධන අගය ඉහළ නැංවීමේ අරමුණින් කොළඹ කොටස් වෙළෙඳපොළේ ලයිස්තුගත හිමිකම් සුරැකුම්පත්වල විවිධාංගීකරණය වූ ආයෝජන කළඹක ආයෝජනය කරන විවෘතාන්ත වර්ධන අරමුදලකි.

විවරණ

අරමුදල් ප්‍රතිලාභය සහ පදනම් ප්‍රතිලාභය



අරමුදලේ ගාස්තු

කළමනාකරණ ගාස්තුව වසරකට **2.25%** (ශුද්ධ වත්කම් අගයෙහි % ක් ලෙස)

භාරකරු සහ භාරකරු ගාස්තුව වසරකට **0.30%** (ශුද්ධ වත්කම් අගයෙහි හි % ක් ලෙස)

සටහන **03:** අරමුදල් ප්‍රතිලාභයට එදිරිව පදනම් ප්‍රතිලාභය

කාලසීමාව*	**අරමුදල**	**පදනම්** **ASPI අගය**	**S&P SL 20**	**සියළු කොටස් මුළු ප්‍රතිලාභ දර්ශකය-ASTRI**
2024 වර්ෂයේ මේ දක්වා –	35.58%	49.66%	58.46%	57.81%
ආරම්භයේ සිට එකතුව.	229.06%	191.14%	64.51%	246.89%
වාර්ෂික වර්ධන අනුපාතය	9.71%	8.67%	3.95%	10.19%

සටහන: සියලු කොටස් මිල දර්ශකය (ASPI), සියලු කොටස් මුළු ප්‍රතිලාභ දර්ශකය (ASTRI) සහ S&P ශ්‍රී ලංකා 20 දර්ශකය

(S&P SL 20) 2024 දෙසැම්බර් 31 වන දිනට කොළඹ කොටස් වෙළෙඳපොළ (CSE) දත්ත මත පදනම් වේ

** කාර්ය සාධනය සම්බන්ධයෙන් මෙහි ඇතුළත් කර ඇති දත්ත 2024 දෙසැම්බර් 31 වන දිනට මාසය අවසාන මිල ගණන් මත පදනම් වේ.*

මෙම ලේඛනයේ ඇතුළත් දත්ත අතීත කාර්ය සාධනය නියෝජනය කරන අතර අනාගත ප්‍රතිඵල සඳහා සහතිකයක් නොවේ.

2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා, අරමුදල 35.58% කින් වැඩි වූ අතර ASPI සහ S&P SL 20 දර්ශක පිළිවෙලින් 49.66% කින් සහ 58.46% කින් වැඩි විය. ආරම්භයේ සිටම අරමුදල එම කාල සීමාව සඳහා සියලු කොටස් මිල දර්ශකයේ 191.14% 6 කාර්ය සාධනය අභිබවා 229.06% ක ප්‍රතිලාභයක් ලබා දී ඇත.

සටහන 04**:** 2024 දෙසැම්බර් 31 වන විට අරමුදලේ ප්‍රධාන ආයෝජන සමාගම් 5

ශුද්ධ වත්කම් අගය මත පදනම්ව ප්‍රධාන ආයෝජන සමාගම් 5		
කොටස්	**සුරැකුම්පත් වර්ගය**	**% ශුද්ධ වත්කම් අගය**
ඇක්සස් ඉංජිනිරිං පී එල් සී	AEL.N0000	**6%**
හේලීස් පී එල් සී	HAYL.N0000	**6%**
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී	PLC.N0000	**6%**
සන්ෂයින් හෝල්ඩිංග්ස් පී එල් සී	SUN.N0000	**5%**
සම්පත් බැන්ක් පී එල් සී	SAMP.N0000	**5%**

සටහන **05:** 2024 දෙසැම්බර් 31 වන විට අරමුදලේ වත්කම් ව්‍යාපාර ක්ෂේත්‍ර අතර ආයෝජනය කර ඇති ආකාරය



2024 පළමු භාගයේදී අරමුදල අවධානය යොමු කළේ පොලී අනුපාත පහත වැටීමෙන් ප්‍රතිලාභ ලබන සමාගම්, දේශීය පරිභෝජනය යථා තත්ත්වයට පත්වීමෙන් ආකර්ෂණය ලබා ගත හැකි පාරිභෝගික අංශ සහ දිගු කාලීනව ප්‍රතිලාභ ලබා ගත හැකි මූලික වශයෙන් ශක්තිමත් ද්‍රවශීලී අංශ කෙරෙහි ය. ඒ අනුව, වෙළෙඳපොළ පොලී අනුපාත තවදුරටත් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කරමින් අරමුදල ප්‍රාග්ධන භාණ්ඩ, බැංකු සහ මූල්‍ය, පාරිභෝගික අංශය සහ සංචාරක අංශයට වෙත බරතැබීම වැඩි කළේය.

වසරේ 4 වන කාර්තුවේදී වෙළෙඳපොළ යම් මට්ටමකට පැමිණියේ මැතිවරණයෙන් පසු අවිනිශ්චිතතාවය විසඳා ගැනීමත් සමඟ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් (IMF) වැඩසටහනේ සිටින බවට ජනාධිපතිවරයාගේ සහතිකය සහ ණය සීමා කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාම ආයෝජක ප්‍රජාව විසින් බෙහෙවින් පිළිගනු ලැබූ බැවිනි. අරමුදල බැංකු අංශයෙන් ලබන ලාභය තරමක් ඉහළ ගිය අතර එම අංශයෙහි වටිනාකම් ඉහළ නැංවීම ද වැඩි කළේය.

වැඩිදියුණු වන ආර්ථික ක්‍රියාකාරකම් සහ අඩු පොලී අනුපාත සමඟ, 2025 දී ඉපැයීම් වර්ධනයක් අපි අපේක්ෂා කරන්නෙමු. තවද, බාහිර ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව නිම කිරීමෙන් සහ ණය ශ්‍රේණිගත කිරීම් වැඩිදියුණු කිරීමෙන් පසුව, කලාපීය සම මට්ටමේ වෙළෙඳපොළවල සාපේක්ෂව ආකර්ශනීය තක්සේරු කිරීම් සැලකිල්ලට ගෙන, විදේශීය ආයෝජකයින් විශේෂයෙන් කොළඹ කොටස් වෙළෙඳපොළ දෙස ධනාත්මකව බලනු ඇතැයි අපි විශ්වාස කරන්නෙමු. පොලී අනුපාත අඛණ්ඩව පහත වැටෙන බැවින්, ස්ථාවර ආදායම් සුරැකුම්පත්

වලින් කොටස් වෙත අරමුදල් මාරු කිරීමක් අපි අපේක්ෂා කරන්නෙමු. කොටස් යනු බදු කාර්යක්ෂම වත්කම් පන්තියක් වන අතර ආකර්ශනීය තක්සේරු කිරීම් සහිත ආයෝජනයක් බැවින්, කොටස් දිගු කාලීන ආයෝජකයින් අතර වඩාත් කැමති වත්කම් පන්තියක් වනු ඇතැයි අපි විශ්වාස කරන්නෙමු. එපමණක් නොව, අයවැයේ බදු සහන පියවර සහ රජයේ සේවකයින් සඳහා වැටුප් වැඩිවීම් මගින් මෙහෙයවනු ලබන වැයකළ හැකි ආදායමේ වැඩිවීම පරිභෝජනය වැඩි කරන අතර එමඟින් 2025 දී වඩා හොඳ ඉපැයීම් අපේක්ෂාවක් බලාපොරොත්තු විය හැක. වෙළෙඳපොළ ධනාත්මක දැක්ම සැලකිල්ලට ගෙන, කෙටි කාලීනව අරමුදලෙන් 80% -90% ක වත්කම් වෙන් කිරීම පවත්වා ගැනීමට අප තෝරා ගන්නෙමු.

2024 දෙසැම්බර් 31 වන දිනට, අරමුදලේ මුළු ශුද්ධ වත්කම් වටිනාකම රුපියල් මිලියන 94.17 ක් වූ අතර අරමුදලේ ඒකක හිමියන් සංඛ්‍යාව 227 කි. 2024 දෙසැම්බර් 31 වන දින අරමුදලේ ඒකක නිදහස් කිරීමේ මිල රුපියල් 32.9062 කි.